# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**විශ්වවිද්‍යාල ප්‍රවේශය – දෘශ්‍ය කලාවේදී /ප්‍රාසංගික කලාවේදී**
**(දෘශ්‍ය කලා/සංගීත/නර්තන/නාට්‍ය හා රංගකලාව) විශේෂ උපාධි පාඨමාලා**

**2015/2016 අධ්‍යයන වර්ෂයේ**
**විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා**
**අයදුම්පත් කැඳවීම(2015 උ.පෙළ ප්‍රතිඵල මත)**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා 2015 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයේදී පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන්ගෙන්, අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

1.1 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම පිණිස, 2015 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අපේක්ෂකයන් විසින් ලබාගත් Z ලකුණු පදනම් කරගනු ලැබේ.

(i) චිත්‍ර හා මූර්ති කලා / සංගීතය / නර්තනය / නාට්‍ය හා රංග කලාව යන විෂයයන් ගෙන් අදාළ විෂයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිතව පෙනීසිටි විෂයයන් තුනෙන්ම සමත් වී සිටිය යුතු අතර,

(ii) පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයෙන් ද 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

සටහන :

කෙසේ වෙතත්, ඉහත (ii) සම්පූර්ණ නොකිරීම හේතුවෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා නොමැති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන්ට ද, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමට අනුමත අ.පො.ස.(උ.පෙ.) අවස්ථා තුනෙන් එක් වරකදී හෝ පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් දැනටමත් ලබා ඇත්නම් හෝ ඉදිරියේදී ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිය.

1.1.2 ඉහත කී සියලුම කාණ්ඩ වලට අයත් සිසුන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ප්‍රවේශය ලැබීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන **විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයෙන්** සමත්විය යුතුය.

**2.සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන එක් එක් පාඨමාලාවට අදාළ තොරතුරු පහත දක්වා ඇත.**

2.1. නර්තන

**උපාධි පාඨමාලාවේ නම- ප්‍රාසංගික කලාවේදී (විශේෂ)**

උඩරට නර්තනය

පහතරට නර්තනය

සබරගමු නර්තනය

දේශීය බෙරවාදනය

කථක් නර්තනය

භරත නර්තනය

විඩියෝ නර්තන රචනය

සන්නිවේදන සහ ජනශ්‍රැති අධ්‍යයනය

සිනමා අධ්‍යයනය

2.2 නාට්‍ය හා රංගකලා

**උපාධි පාඨමාලාවේ නම – ප්‍රාසංගික කලාවේදී (විශේෂ)**

රූපණය

නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය

මුද්‍රානාට්‍ය හා නව නර්තනය

2.3 සංගීත

**උපාධි පාඨමාලාවේ නම**

ප්‍රාසංගික කලා (විශේෂ) - උත්තර භාරතීය සංගීත

ප්‍රාසංගික කලා (විශේෂ) – මානවවංශ සංගීත විද්‍යා

ප්‍රාසංගික කලා (විශේෂ) – බටහිර සංගීත

ප්‍රාසංගික කලා (විශේෂ) - ව්‍යවහාරික සංගීත සහ ජනසන්නිවේදන

ප්‍රාසංගික කලා (විශේෂ) - දක්ෂිණ භාරතීය සංගීත

ප්‍රාසංගික කලා (විශේෂ) - සංගීත විද්‍යා

2.4 දෘශ්‍ය කලා

**උපාධි පාඨමාලාවේ නම – දෘශ්‍ය කලාවේදී (විශේෂ)**

චිත්‍ර කලා

මූර්ති කලා

මුද්‍රණ කලා

දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ සැලසුම්

බහුශික්ෂණාත්මක නිර්මාණ සැලසුම්

සෙරමික් මූර්ති

සෙරමික් සැලසුම්

බහුමාධ්‍ය කලා

රෙදිපිළි හා ඇගළුම්

ඉතිහාසය හා කලා සිද්ධාන්ත

**03. විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :**

මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුව තමා විසින් පිළියෙල කර ගත් අයදුම් පත්‍රයක් 2016.05.27 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ලිපියේ ඉහල වම් කෙළවර " **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය 2015/2016**" ලෙස හා "**අයදුම්කරන පාඨමාලාව**" ද සඳහන් කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍ය සේවා<br>
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>
නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය<br>
කොළඹ 07.

සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ඔබගේ නම හා ලිපිනය ලියූ අඟල් 9 × 4 ප්‍රමාණයේ රු. 50/- ක මුද්දර ගැසූ ලිපි කවරයක් සහ බැංකුවට මුදල් ගෙවන ලද වවුචරයේ මුල් පිටපත ද අමුණා එවිය යුතුය. වෙනත් කිසිදු ලියවිල්ලක් අයදුම්පතට අමුණා එවීම අවශ්‍ය නොවන අතර මුදල් ගෙවූ වවුචරයේ ඡායා පිටපත් ද භාරගනු නොලැබේ.

අ.පො.ස.(උ.පෙළ) සෞන්දර්ය විෂයන් දෙකක් සඳහා පෙනී සිට එම විෂයන් දෙකෙන්ම විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තුවන අපේක්ෂකයන් වෙන වෙනම එම විෂයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු ගෙවීම සහ අයදුම්පත් දෙකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**නර්තන සහ නාට්‍ය හා රංගකලා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කිරීමද අනිවාර්ය වේ.**

පාසල් අයදුම්කරුවෙකු නම් විදුහල්පති විසින් ද, බාහිර අයදුම්කරුවෙකු නම් විහාරාධිපතිවහන්සේ කෙනෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් ද, අයදුම්පතේ අංක 09 හා 10 යටතේ සඳහන් කර ඇති ප්‍රතිඵල සහතික කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

- **අයදුම් පත්‍රය ඒ 04 ප්‍රමාණයේ කඩදාසියක තනි පිටුවක සකස් කරගත යුතුය.**

**04. විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු :**

විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවකුගෙන් රු. 1500/- ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ලබා ගත හැකි වවුචර්පත් මගින්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුව නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ඇති අංක **5276145** දරණ ගිණුමට බැර වන පරිදි ගෙවිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රවේශයට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **එවැනි අවස්ථාවක දී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

**05. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කර තිබිය යුතුය.**

**06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.05.27 වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම ප්‍රායෝගික පරීක්ෂණය ජූනි මස මැදදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් වෙත යථා කාලයේ දී පෞද්ගලිකවම දැනුවත් කරනු ඇත.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන බව කරුණාවෙන් සළකන්න.**

දුරකථන අංක :- 0112033710
(දිගුව : නර්තන/නාට්‍ය හා රංග කලා - 1002, දෘශ්‍ය කලා - 1004,
සංගීත – 1005)

ලේඛකාධිකාරී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,
21, ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ 07

2016.05.06

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය දෘශ්‍ය කලා/සංගීත/නර්තන/නාට්‍ය හා රංගකලා පාඨමාලාවට තෝරා ගැනීම සඳහා වූ විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය**

**අයදුම් පත්‍රය**

01. සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
02. සම්පූර්ණ නම (ඉංග්‍රීසි) : ..................................................................................
03. මුලකුරු සමග නම (සිංහලෙන්): ...........................................................................
04. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) : ..................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :- ...............................................
06. ස්ත්‍රී/පුරුෂ භාවය :- ......................................................
07. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :- ..............................................................................
(ඉංග්‍රීසියෙන්) :- ..................................................................................
08. දුරකථන අංකය/ අංක :- ..........................................................................................
09. 2015 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි පරිපාලන දිස්ත්‍රික්කය : ...........................
10. 2015 අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල (පහත සඳහන් සටහනට අනුව*)

විභාග අංකය : [ ]

ලැබූ ලකුණු සංඛ්‍යාව : (Z ලකුණු) [ ]

සාමාන්‍ය පොදු ප්‍රශ්ණ පත්‍රයේ ලකුණු [ ]

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

*** ප්‍රතිඵල සහතික කිරීම :**

මෙම අපේක්ෂකයා විසින් ඉහත අංක 09 සහ 10 යටතේ සඳහන් කර ඇති තොරතුරු, මුල් සහතිකවල තොරතුරු හා සැසඳෙන බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

සහතික කරන අයගේ

නම : ..........................................................................................

නිල මුද්‍රාව :

දිනය : ..............................

.................................................

විභාරාධිපති/විදුහල්පති/සාමදන විනිශ්වයකාර

11. හැදෑරීමට අපේක්ෂා කරන විෂයය ක්ෂේත්‍රය

සංගීත [ ] නර්තන [ ] නාට්‍ය හා රංග කලාව [ ] දෘෂ්‍ය කලා [ ]

12. විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාව හා දිනය : ...................................
(බැංකුව විසින් මුද්‍රා තබා, බලයලත් නිලධාරියෙකු විසින් අත්සන්කොට ඇති ගෙවීම් වවුචරයේ පිටපත මෙයට අමුණා එවිය යුතුය. ජායා පිටපත් බාරගනු නොලැබේ.)

මා විසින් ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. තවද අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ 2015 උ.පෙළ වර්ෂයට අයත් නොවන බව තහවුරු වුවහොත් විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිමෙන් පසුව වුවද මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බව පිළිගනිමි.

.............................................

දිනය : ......................

අයදුම්කරුගේ අත්සන